# An introduction to Buddhist Thoughts and Institutions in Sri Lanka

**Ven. Kudawawe Somananda**

The community of the Sangha can be considered as a social unit that operates upon a number of simple and noble objectives that exhibit organized and institutionalized traits based on certain aims and principles. Further, openly demonstrating the features of a model a community while realizing their path of liberation through the attitudes of the community of Sangha, for making the life of others fruitful, maintaining a simple life style and keeping away from narrow social aspirations the community of Sangha functioned as an organized institution in the early stages.

With the increasing of the membership of Sangha and with regional expansion, through dialogue and accords, maintaining their essential qualities in the same way, how the monks worked is clearly seen in the history of the Order. A number of agreements were made for the well-being of the community through a number of *'Katikāvat'*(ecclesiastical codes) and *Sangāyana* (council or convocation), on every such occasion the monks had acted giving preference to the Dharma-Vinaya and common welfare over personal gains and interests. The community of monks had progressed successfully by working on such ideals that they acted as a well organized community fulfilling their main objectives of attaining goals of welfare of the community.

The institution of the Bhikkhus which originated in the 6th century B.C. representing the *Indianśramana* movement came to be better organized. This happened in India in the 6th century B.C., but after 3 centuries, Sri Lanka felt its influence as the direct result of the Indo-Lankacultural relationship developing at the time. However, according to some scholars, early immigrants from India may have had some knowledge of Buddha and his religion before the arrival of Ven. Mahinda and other monks to officially establish Buddhism

in the Island. Through literary and archeological evidence it has been clearly proven that it was in the 3rd century B.C. that the institution of the Sanghaoriginated in Sri Lanka.

Activities of the Sangha from that time has been marked until the present era, the Sangha had played a very prominent role in the history of the island. Therefore it is important to study how the Sangha became an organized community and to examine the occasional conflicts among the Sangha and how those conflicts and new views affected the social attitudes of the Sangha. We shall focus on the period from the 3rd century B.C. up to the end of the Kandyan period for understanding the evolution of the Sangha during that time and its structural basis.

In this study special attention will be paid to 'instituitons.' The Mahavihara in Anuradhapura was the firstmonastery of the Sangha in Sri Lanka and also it is known as the place of origin of the culture of the island. Further, a unique tradition of the Sangha developed at the Mahavihara. Members of the Mahavihara were known as the *Theravadins*, as they upheld the Theravada traditions. The Mahavihara School contributed immensely to the development in the religious and cultural fields in the island while shaping the socio-economic and political sectors of a new pattern. The MahviharaSchool continued to make their contribution in these fields for a long time.

A rival movement of the Sangha of the Mahaviharaarose at the Abhayagiri Vihara, which developed fast into an institution. The breach which occurred like this resultednot only directly but also indirectlyin the establishment of various ideologies hostile to the Theravada, but also it affected every aspect insociety. The doctrines embraced by the members of the Abhayagiri Vihara, changed drastically under the impact of the ideas of the *Dhammaruci* monks who came to the Abhayagiri and occupied it. It did not take a long time for the Mahayana champions of the Vaitulyavada doctrine to bring monks propagating new radical ideas. Due to the conflicts between the Mahavihara and Abhayagiri involving foreign monks bringing in new ideologies and interpretations those two monasteries gained international fame. While those two great monasteries upheld different views, their differences widened into a serious conflict before long. The division in implementation and tradition continued up to the12th century while it aggravated into sectarian conflicts.

Having the JetavanaStupa at the center, a new Nikaya or sect of monks

developed by the name *'Jetavana.'* This Stupa was built within the boundary of the Mahavihara disregarding the protest of the Mahaviharabhikkhus. Although located within the Mahavihara the members of the Jetavana did not accept the Theravada tradition of the Mahavihara. It was obviously a new sect that emerged against the Mahavihara tradition. Jetavana monastery had agreed with the ideas ofthe Abhayagiri to some extent only. They existed as an independent sect up to the 12th century. Further, the monks of the Jetavana had accepted to some extent the views of the Abhayagiri. After the 8th century Bhikkhus who had embraced the ideas of the Vajiriyavada and the Nilapatadarshana arrived in the island where they made attempts to spread their views. In the meantime we find a new development in Sangha of the island with the introduction of *Mūlāyatana* within the institution of Sangha which was already divided into various Nikayas. By the 10th century these schools were established as 'Mūla',which means 'community' or 'group'. This name can be found in some of the ancient inscriptions as well. Among those *'mulas', 'Uturumula', 'Seneviratmula', Vahadumula'*, and *'Kapārāmula'* are some of the prominent ones.

While the *'Sāsana'* or the Order of the Bhikkhus was getting divided into many Nikayas or sects, they had attempted new interpretations of the Dharma and Vinaya. Hence we can see a change in the functions and attitudes of the communities of Bhikkhus after the 6th century. While some monks begin to concentrate on the 13 *Dhutangas* (austere ascetic practices) highlighted in the early Buddhism we can see after the 5th century emergence of some Bhikkhus who tried to participate in the social activities rather than monks who accepted views of other Nikayas relating their principles to it.

Those schools which arose from 8 principal Pirivenas around the 7th century, and continued to grow, emerged by the name of *'Mūlāyatana'* within the institution of Sangha in addition to the Theriyavada and Vaitulyavada maintained at the Mahavihara and AbhayagiriVihara. Amongthe *'mulas'*, *'Uturumula'*,'Seneviratmula', Vahadumula' and 'Kapārāmulabelonged to the Abhayagiri Vihara. The remaining four 'mula' or establishments belonged to the Jetavana and Mahavihara factions. The *'mulas'*, as institutions of presented different views representing the 3 main Nikayas as well as lineages of highly respected scholar monks. Each *'mula'* mayhave borne the views of the Chief Monk of that *Mula*. Although in the beginning the principles or the doctrine was given prominence in the order of monks, later on that was replaced by the *'paryāpti'* or learning and then with the development of *Mūlāyatana* at Pirivenas. From this development also we can see that a structural change was

taking place in the life of the monks.

King Vijayabahu managed to reunite the country politically and establish an indigenous leadership in the 11th century who took opportune measures for the welfare of the Sasana. However, the conflicts among the Nikayas and the propagation of heretic views had not been completely wiped out. The extremely difficult task of re-building unity and harmony in the institution of Sangha who had been divided on ideologies, sects and *'āyatana'* or *'mula'*, was undertaken by Parkaramabahu I during the Polonnaruva period in the 12th century.

It was at that time that the emergence of a new feature- the Chief position of *'Māhimi'* or *'Mahāsamai'*, was established. The *'Māhimi'* represented the supreme leadership of the entire community of the Sangha. At the same time a hierarchy based on leadership in the Sangha was formed. In the meantime the *'Mūlāyatana'* became more prominent than in the earlier periods and those institutions claimed the privileged positions enjoyed by the Nikayas until then. According to a strong hierarchy of the community of monks, it was the *'ubhayavāsa'* (the village living and forest dwelling monks) that became more active and powerful.

The next layer of the community of monks was led by the *'pirivenpati'* or the principals of the *'pirivenas'* or the monastic schools. Such schools existed in a number of areas in the island and the head monks of them were called either *'piriventhera'* or *'pirivenpati.'*

By the Gampola period what is seen from the state of the Sāsana is that in the *'Sāsana*, which was controlled by means of *'Katikāvat'* and 'accords', once again the personality became instrumental and the leaders functioned who were alienated from ecclesiastical duties. Further, it seems that by this time the monks of Sri Lanka were involved in the religious activities in other South Asian countries. The reign of King Parakarmabahu VI of Kotte (1416-1468) is noteworthy as a flourishing era of the *Sāsana*- the order of Monks. There was an active relationship between the Buddhist monks of Sri Lanka with those of South Asian countries during that period.

With the Portuguese advent in the Island in 1505 A.D. there begins a decline of the Order of the Sangha. Buddhist monks as well as Buddhist laity fell into a pathetic state at that time while a number of obstacles appeared which threatened the existence and activities of the monks.

Active relationship of the Bhikkhus with the rulers of the Island, which

started during the Anuradhapura period continued up to the last kingdom in Kandy in the 19th century. Further decline was seen of the institution of Sangha as the result of the competition for power that developed among the members of the Royalty as well as officers holding high positions. Beginning of this decline could be seen clearly since the 16th century.

An institution of *'Sāmanera'* or novice monks called *'Ganinnānse* came to be established during the Kandy period. At that time the traditional system of 'teacher- student' relationship was replaced by the new *'gnāti-shisya'* system and the resulting 'relative- pupil' relationship gets established among the Sangha. Then the ordination as Bhikkhus also became confined within family circles. The Bhikkhus at that time were practicing as devil dancers, astrologers, land owners and maintaining families sacrificing the Vinaya or the 'code of conduct.'

The movement called the *'SilvatSamāgama'* (Company of Virtuous monks) led by Venerable Welivita Saranamkara was successful in cleansing the Order of corruption and violation of Vinaya rules etc., marked the dawn of an era of revival. From this movement the basic structural features of the Order of Bhikkhus of Sri Lanka, the role of the members and the changes taking place and also the measures adopted for introducing *'katikāvat'* and agreements and attempts to connect the aims of monks to society. Despite all these, the Bhikkhu organizations have moved forward.

However, institution of the Sangha that is formed upon a common foundation being divided into groups with the emergence of various institutions and individual leadership and the rise of personal objectives over common objectives caused decline of the 'Sangha' as an institution. Its progress at some other times will be discussed in this project. We shall discuss further, as the establishment of foreign rule had an adverse effect on the local leaders and how the loss of their power led to struggles for political power and the future of the Order of the Monks.

## Bibliography

***Mahavamsa,*** tr.1950. Wilhelm Geiger, Colombo: Government Information Dept.

***Vamsatthappakasini,*** Vol. I, II, 1935.ed. G. P.malalasekara, London, P.T.S.

Adikaram, E.W. 1953. ***Early history of Buddhism in Ceylon***, Colombo: M. D. Gunasena& Co. Ltd.

Ellawala, H. 1969. ***Social History of Early Ceylon***, Colombo:Department Of Cultural Affairs.

Gunawardane, R. A. L. H. 1979. ***Robe and Plough***: monasticism and Economic

Interest in Early Medieval Sri Lanka, Arizona: The University Of Arizona.

Rahula, Walpola 1956. ***History of Buddhism in Ceylon***, Colombo: M. D. Gunasena & Ltd.

# නාට්‍යයෙහි භාවිත වෘත්ති පිළිබඳ සංක්ෂිප්ත විමසුමක්

පූජ්‍ය බලදොර ඉන්දජෝති හිමි

## හැඳින්වීම

සංස්කෘත නාට්‍ය කලාවෙන් පෙරදිග නාට්‍යය සඳහා හිමි වූ දේ අති විශාල ය. පෙරදිග මහා නාට්‍ය මූලධර්ම කෘතියේ සම්පාදක භරත මුනි මේ සඳහා කළ දායාදයට පෙරදිග ලෝකයා පමණක් නො ව සමස්ත ලෝකය ම ණය ගැති වේ. ලෝකයේ නොයෙක් ජන සම්ප්‍රදායගත නාට්‍ය වර්ග පැවතිය ද, නාට්‍ය මූලධර්ම සම්පාදනය අතින් භරතමුනි දැක් වූ විශේෂත්වය ලෝකයට නාට්‍ය මූලධර්ම පිළිබඳ ව සාකච්ඡා කරන්නට ඉඩ සැලසී ය. එසේ වූ මූලධර්ම අතර නාට්‍යයේ භාවිත වෘත්ති පිළිබඳ හඳුනාගැනීම අපගේ මෙම කෙටි විමසුමේ අභිප්‍රාය යි. නාට්‍යයේ භාවිත වෘත්ති වූ කලි නාට්‍යක වාචික හා ආංගික අභිනය භාවිතය කෙසේ විය යුතු ද යන්න පිළිබඳ ව සාකච්ඡා කෙරෙන අංශය යි. ඒ අනුව පාත්‍රයාගේ හැසිරීම සම්බන්ධ ප්‍රධාන අංශ සාකච්ඡා කෙරෙනුයේ වෘත්ති මගිනි. නායක නායිකාවන්ගේ ව්‍යාපාරයේ විශේෂත්වය ම නාට්‍යයෙහි වෘත්ති ලෙසින් සැලකේ.

## නට්‍යවෘත්ති හැඳිනගැනීම

වෘත්තීන් නාට්‍යවේදයෙන් පැනනැගුණු බවත් වාචික හා ආංගික අභිනය ආත්ම කොට ඇති බවත් විශ්වාස කෙරෙයි (**නාට්‍යශාස්ත්‍ර, XX.**24). පාත්‍රයන්ගේ ව්‍යාපාරයේ ස්වභාවය වෘත්ති නමින් හැඳින්වේ (**දශරූපභාෂ්‍ය, 56.පිට.**). වෘත්ති යනු නාට්‍යයේ පාත්‍රයන්ගේ ශාරීරික හා වාචික අභිනයන් හා සම්බන්ධ වූවකි. රාජශේකර විලාසවින්‍යාසය වෘත්ති ලෙස හඳුන්වයි. (**කාව්‍යමීමංසා**) වෘත්ති රස සමඟ ඍජු ව සම්බන්ධ වේ. වෘත්ති නාට්‍යයේ මව ලෙස ද පිළිගැනෙයි (**නාට්‍යශාස්ත්‍ර, XVIII.**4). නාට්‍ය වෘත්ති හතරකි (**සාහිත්‍යදර්පණ, VI.**123.).

කෛශිකී
සාත්වතී
ආරභටී
භාරතී යනුවෙනි.

## 1. භාරතී වෘත්තිය

යා වාක්ප්‍රධානා පුරුෂප්‍රයෝජ්‍යා ස්ත්‍රීවර්ජිතා සංස්කෘතපාඨ්‍යයුක්තා

ස්වනාමධේයෛර්භරතෛඃ ප්‍රයුක්තා සා භාරතී නාම භවේත්තු වෘත්තිඃ

(**නාට්‍යශාස්ත්‍ර, XX**ශ26.).

භාරතී වෘත්තිය වචන ප්‍රධාන කොට ඇත්තේ වේ. එනම් පඨනය ප්‍රධාන වේ. එය ද ස්ත්‍රීන්ගෙන් තොර වූයේ පුරුෂයන් විසින් පමණක් ඉදිරිපත් කරනු ලබයි. සංස්කෘත සංවාදවලින් පමණක් යුක්ත වේ. මෙහි භරතයන් තමන්ගේ පෞද්ගලික නමින් ම පෙනී සිටියි. භාරතී වෘත්තියේ ප්‍රභේද 4කි. ප්‍රරෝචනා, ආමුඛ, වීථි හා ප්‍රහසන වශයෙනි (**නාට්‍යශාස්ත්‍ර, XX.**27).

### 1.1 ප්‍රරෝචනා

ප්‍රරෝචනා යනු සූත්‍රධර විසින් කරනු ලබන ආමන්ත්‍රණයකි. මෙයින් නාට්‍යය රඟ දැක්වීමට හේතුව රඟ දැක්වෙන අවස්ථාව ආදිය ප්‍රකාශ වෙයි. ප්‍රරෝචනාවේ ජය, සමෘද්ධිය, ශුභසිද්ධිය විජයග්‍රහණය පිළිබඳ ව සහ පව් ශමනය අපේක්ෂා කෙරෙන වාක්‍යය ඇතුළත් වෙයි.

### 1.2 ආමුඛ (ප්‍රස්තාවනා)

නටී සහ විදූෂක හෝ එබඳු වෙනත් නළුවෙක් තම කාර්යන් පිළිබඳ සංලාපයෙහි යෙදීමේ අවස්ථාව ආමුඛ නම්. ප්‍රස්ථාවනා යනු ද මෙය ම වේ (**නාට්‍යශාස්ත්‍රය, XX.**30-31.). මෙහි අංග පහකි. උද්ඝාතක, කථෝද්ඝාතක, ප්‍රයෝගාතිශය, ප්‍රවෘත්තක, අවලගිත වශයෙනි.

#### 1.2.1 උද්ඝාතක

අවබෝධ කරගන්නා ලද අර්ථය ගෞරවය  කරණකොටගෙන වෙනත් පද හා ගළපා යළි පළ කිරීම උද්ඝාතක නම් වේ (**නාට්‍යශාස්ත්‍ර, XVIII.**115-116.).

#### 1.2.2. කථෝද්ඝාතක

සූත්‍රධරගේ වාක්‍යක් හෝ වාක්‍යාර්ථයක් ගෙන ඒ පිළිබඳ සඳහන් කරමින් පාත්‍රයෙක් පිවිසේ නම් ඒ කථෝද්ඝාත නම් වේ (**නාට්‍යශාස්ත්‍රය, XX.**35.).

#### 1.2.3. ප්‍රයෝගාතිශය

සූත්‍රධර ප්‍රස්ථාවනාවෙහි කරන ඉදිරිපත් කිරීමක් අතරතුර තවත් පාත්‍රයෙක් වේදිකාවට පිවිසේ නම් ප්‍රයෝගාතිශය නම් වේ (**නාට්‍යශාස්ත්‍රය, XX.**36.).

#### 1.2.4. ප්‍රවෘත්තක

එළඹ ඇති කාලයක් පිළිබඳ වර්ණනාවක් කරනු ලැබේ නම්, එය ඇසුරු කරගෙන වේදිකාවට පාත්‍රයෙක් පිවිසීම මෙ නමින් ගැනේ (**නාට්‍යශාස්ත්‍රය, XX.**37.).

### 1.2.5. අවලගිත

එක් කාර්යක් එක් තැනක පිහිටුවා ඒ අතර වෙනත් යමක් පැහැදිලි කිරීම අවලගිත නම් (**නාට්‍යශාස්ත්‍ර, XVIII.**18.116-117.).

### 1.3. වීථි

සියලු රසයන්ගෙන් හා ලක්ෂණයන්ගෙන් අනූන වූ, එක් නළුවෙකු හෝ දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ඒකාංග නාට්‍යය ප්‍රභේදයකි. එහි උත්තම, මධ්‍යම හා අධම ගණයේ පාත්‍රයෝ තිදෙනෙක් වෙත්. උද්ඝාතක, අවලගිත, ආස්පන්දිත, නාලී අසත්ප්‍රලාප, වාක්කේලී, ප්‍රපඤ්ච, මෘදව, අධිබල, ඡල, ත්‍රිගත, ව්‍යවහාර, හා ගණ්ඩ යන අංග දහ තුන මෙයට ඇතුළත් වේ (**නාට්‍යශාස්ත්‍රය, XVIII.**112-114). අවබෝධ කර ගත් අර්ථය වෙනත් පද හා ගළපා යළි පළ කිරීම උද්ඝාත්‍ය ද, කාර්යක් එක් තැනක පිහිටුවා වෙනත් කාර්යක් පහදවනු ලැබීම අවලගිත ද, ප්‍රකාශ වුණු කිසියම් දෙයක ශුභාශුභ ඉස්මතු වී ඇති විට කෞශල්‍යයෙන් වෙනත් අර්ථයකට නඟා දැක්වීම ආස්පන්දිත ද, හාස්‍ය රසයක් දනවන අර්ථ ප්‍රහේලිකා නාලිකා ද, මෝඩයන් ඉදිරියේ වියතෙක් යහපත් දෙයක් පවසන විට එය ඔවුනට තේරුම් ගැනීමට නො හැකිවීම අසත්ප්‍රලාප ද, ප්‍රශ්නෝත්තර එකක් හෝ දෙකක් ඉදිරිපත් කිරීම වාක්කේලි ද, දෙදෙනෙකු අතර කිසියම් ප්‍රතිලාභයකට හේතු වූ සහ හාස්‍ය දනවන, ප්‍රසංසා ගැබ්ව ඇති අසත්‍ය සංවාදය ප්‍රපඤ්ච නම් ද, කිසියම් විවාදයකින් ගුණයන්ගේ දොස් දක්වීමක් වී එම දොස් ගුණීකරණය මෘදව නම් ද, අනෙකෙකුගේ හා තමාගේ වචන අන්‍යෝන්‍ය වශයෙන් විශේෂයෙන් උත්කෘෂ්ටත්වයෙන් උත්කෘෂ්ටත්වයට පත්වීම අධිබල නම් ද, ඒක අයෙකුට හාස්‍ය අනෙකෙකුට රෝෂය ද දනවෙන වාක්‍යය ඡල නම් ද, ශබ්දයන්ගේ සමානත්වය නිසා යම් ප්‍රකාශයක් නොයෙක් අර්ථයන් දෙන සේ යෙදීම ත්‍රිගත නම් ද, පැහැදිලි ව ගොතන ලද ප්‍රකාශයක් හාස්‍ය මතු කරන අර්ථයක් දීම ව්‍යාහාර නම් ද, කලබල හා කැලඹිලි සහිත විවාදාත්මක මෙන් ම අපවාද ගැබ් වූ බොහෝ වචන පිට කිරීම ගණ්ඩ නම් ද වේ (**නාට්‍යශාස්ත්‍රය, XVIII.**115-126).

### 1.4. ප්‍රහසන

ශුද්ධ සංකීර්ණ වශයෙන් ප්‍රහසන ද්විවිධ වේ (**නාට්‍යශාස්ත්‍රය, XVIII.**101). භික්ෂූන්, තාපසයන්, බ්‍රාහ්මණයන් ආදීන් හා වෙනත් පුද්ගලයන් විසින් කරනු ලබන හාස්‍ය ජනක සංවාද සහිත, පහත් චරිතයන්ගේ විහිළු තහළු සහිත සංවාද බහුල, අසත්‍ය හා අස්ලීල භාවයෙන් තොර භාෂා හැසිරවීමෙන් යුතු වූ ද, විශේෂ වූ භාවයන්ගෙන් බිහිවන දෙබස් ඛණ්ඩ ඇත්තා වූ ද, නිසි අරමුණක් කරා ඇදෙන වස්තු විෂයක් ඇත්තේ ශුද්ධ ප්‍රහසනය යි (**නාට්‍යශාස්ත්‍රය, XVIII.**103-104). වේශ්‍යා, චේට, නපුංසක, විට, ධූර්ත හා අපිරිසිදු චරිතයක් ඇති ස්ත්‍රීන් ආදිය චරිත වශයෙන් සිටින, එළිපිට ඇඳුම් පැළැඳුම් ලා ගැනීම්, හැසිරීම් හා ක්‍රියාවන් නිරූපණය කරන ප්‍රහසනය සංකීර්ණ ප්‍රහසන නම් වේ (**නාට්‍යශාස්ත්‍රය, XVIII.**105). මෙම වෘත්තිය බීභත්ස හා කරුණ රස ප්‍රකට කරයි (**නාට්‍යශාස්ත්‍රය, XX.**74).

## 2. සාත්වතී වෘත්තිය

යා සාත්වතේනේහ ගුණේන යුක්තා න්‍යායේන වෘත්තේන සමන්විතා ච

හර්ෂෝත්කටා සංහෘතශෝකභාවා සා සාත්වතී නාම භවේත්තු වෘත්තිඃ

**(නාට්‍යශාස්ත්‍ර, XX.41)**

සාත්වතී මානසික ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වේ, රංගනය ප්‍රධාන කොට ඇත්තේ වේ. සාත්ව ගුණයෙන් යුතු, න්‍යායන්ගෙන් හා වෘත්තයන්ගෙන් සමන්විත වූ සාතිශය හර්ෂය හා යටපත් කරගන්නා ලද ශෝක භාවය ප්‍රකට කරන්නා වූ ද වෘත්තිය සාත්වතී නම් වේ.(**නාට්‍යශාස්ත්‍රය, XX.**41) මෙය වාචික හා ආංගික අභිනයන් ප්‍රධාන කොට පවතියි. තව ද වීර, අද්භූත, හා රෞද්‍ර රසයන් ගෙන් අනූන වේ. ශෘංගාර කරුණ රසයන්ගෙන් හා නිර්වේද භාවයෙන් ද හීන වෙයි. අහංකාර පුරුෂයන් බහුල ය. අන්‍යෝන්‍ය සට්ටනවලින් යුක්ත ය. මෙහි ප්‍රභේද 4කි. උත්තාපක, පරිවර්තක, සල්ලාපක, හා සංඝාත්‍ය වශයෙනි. මම නැගිටිමි, තාගේ ශක්තිය පෙන්වව යනාදි වශයෙන් ගැටුමක් සඳහා සූදානම උත්තාපක නමි. ගැටුම සඳහා පැණනැගුණු කරුණු ඉවත ලා වෙනත් කරුණු කෙරෙහි එල්බ ගැනීම පරිවර්තක නමි. ධර්මයෙන් හටගත්, අධර්මයෙන් හටගත්, රාග දෝෂාදියෙන් යුක්ත, පිළිකුල් සහගත වචන යන සිව් භේදයෙන් යුක්ත වූයේ සල්ලාපක නමි. මන්ත්‍රාර්ථයක් ගැබ් වුණු වාක්‍යයන්ගේ ශක්තිය හෝ දෛවය හේතු කොට ගෙන හෝ තමන්ගේ දෝෂය නිසා හෝ සන්ධානයක බෙදීමක් ඇති වීම සංඝාත්‍යක නමි. (**නාට්‍යශාස්ත්‍ර, XX.**41-52) මෙම වෘත්තිය වීර හා අද්භූත රස ඇසුරු කරන්නේ වේ. (**නාට්‍යශාස්ත්‍ර, XX.**73)

## 3. කෛශිකී වෘත්තිය

යා ශ්ලක්ෂ්ණනෛපථ්‍යවිශේෂචිත්‍රා ස්ත්‍රීසංයුක්තා යා බහුනෘත්තගීතා

**කාමෝපභෝගප්‍රභවෝපචාරා තා කෛශිකීං වෘත්තිමුදාහරන්ති.**

**(නාට්‍යශාස්ත්‍ර, XX.53.),**

කෛශිකී ශාරීරික ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ වේ. අලංකාර භූෂණ ආදිය නිසා මනෝඥ ස්ත්‍රී චරිතයන්ගෙන් යුක්ත වූ, නැටුම් ගැයුම් බහුල, කම් සුව සේවනය නිසා පැන නැගුණු හැසිරීම් ඇත්තා වූ වෘත්තිය කෛශිකී නම් වේ (**නාට්‍යශාස්ත්‍ර, XX.**53.). ඒ අනුව මෙහි බොහෝ වාද්‍යය, නෘත්‍යය, ගීතාදියෙන් අනූන වූ ද, ශෘංගාරාත්මක අභිනයෙන් හා විසිතුරු නේපථ්‍යයෙන් සමන්විත වූ ද, මල්දම් හා ආභරණ ආදියෙන් හා ප්‍රශස්ත වේෂයකින් සැරසුණා වූ ද, කාන්තාවන්ගෙන් යුක්ත වූ විසිතුරු පද හා වාක්‍ය ප්‍රබන්ධයන්ගෙන් අලංකෘත වූ, සිනාසීම්, හැඬීම්, රොස් වීම් ආදියෙන් හා ස්ත්‍රී පුරුෂයන්ගේ කාම සම්භෝගාදියෙන් බහුල බවක් දක්නට ලැබේ (**නාට්‍යශාස්ත්‍ර. XX.**54-55.). නර්ම, නර්මස්ඵුඤ්ජ, නර්මස්ඵෝට නර්මගර්භ යනුවෙන් මෙහි භේද හතරකි. ශෘංගාරය පදනම් කොටගත්, පිරිසිදු, හාස්‍ය උපදවන හා වීර රසයෙන් තොර යනුවෙන් නර්මය ත්‍රිවිධාකාර වේ. මෙය ඊර්ෂ්‍යා හා ක්‍රෝධ බහුල, දොස් පැවරීම් බහුල, තමන් දෝෂ දර්ශයට ලක් කිරීම හා රැවටිලිවලින්

යුක්ත වේ. ප්‍රථම හමුවීමෙන් ලබන සම්භෝග සුවය රතිය උපදවන වේශ හා පෙම් බස් හා භයානකාත්මක අවසානය ලක්‍ෂණ කොට ඇත්තේ නර්මපුඤ්ජ නම්. විවිධ භාවයන්ගේ සුවිශේෂ වූ අංශුමාත්‍රයන්ගෙන් අලංකාර වූයේ, රසයක් සම්පූර්ණ වශයෙන් ජනිත නො කරන්නේ නර්මස්ඵෝට නම්. බුද්ධිය, රූප ශෝභාව, ධනය ආදි ගුණයන්ගෙන් අවථානුකූල ව නායකයා තමස්වරූපය වසාගෙන පැතිරේ ද එය නර්ම ගර්භ නම් වේ. මුලින් සිටි නායකයා විපතට පත් වුවහොත් වෙනත් නායකයෙක් ඉදිරිපත් වීම නර්මගර්භයට ගැනේ (**නාට්‍යශාස්ත්‍ර, XX**.55-62.). මේ වෘත්තිය හාස්‍ය හා ශෘංගාරය බහුලකොට ඇත්තේ වේ (**නාට්‍යශාස්ත්‍ර, XX**.73.).

## 4. ආරභටී වෘත්තිය

ආරභටප්‍රායගුණා තථෛව බහුකපටවඤ්චනෝපේතා

දම්භානෘතවචනවතී ත්වාරභටී නාම විඥේයා (**නාට්‍යශාස්ත්‍ර, XX**.64.).

ආරභටී ද ශාරීරික ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ වේ. බොහෝ සෙයින් එඩිතර පුද්ගලයන්ගේ ගුණයන් ඇතුළත් වූයේ ද, බොහෝ වූ කපටිකම් හා වඤ්චාවන්ගෙන් අනූන වූයේ ද, රැවටිලි හා මුසා බසින් යුතු වූයේ ද ආරභටී නම් වේ (**නාට්‍යශාස්ත්‍ර, XX**.64.) තව ද වේදිකා සැරසිලි, ඇදවැටීම්, පැනීම්, එතෙර වීම්, සිඳීම්, මායා හා ඉන්ද්‍රජාල හා විවිධ සටන් ආදිය මෙහි වේ. බොහෝ සෙයින් මෙහි දී බලහත්කාරකම්, රැවටීම්, උපද්‍රව ආදියෙන් යුක්ත වූ, අර්ථ ලාභ හා අලාභ ආදිය දැකිය හැකි ය. සංක්‍ෂිප්තක, අවපාත, වස්තුත්ථාපන, සංඵේට යනුවෙන් ප්‍රභේද හතරකි. විශිෂ්ට වේදිකා සැරසිලි, විසිතුරු නේපත්‍ය ඇත්තා වූ, සංක්‍ෂිප්ත වස්තු විෂයන් යුක්ත වූයේ සංක්‍ෂිප්තක නම්. භය හා හර්ෂය පැන නැඟීම, උපද්‍රව, ඇදවැටීම්, කලබල ස්වභාවය, ශීඝ්‍ර ප්‍රවේශ හා නිෂ්ක්‍රමණ ඇත්තේ අවපාත නම්. සියලු රසයන් හකුළුවා ඇත්තා වූ, කැලඹිලි ඇත්තා වූ හෝ නැත්තා වූ ද සිද්ධියක් නාට්‍යානුසාරයෙන් දැක්වීම වස්තුත්ථාපන නම්. කලබල වාතාවරණයක් ඇත්තේ ද, නොයෙක් සටන් හා මල්ලව යුද්ධ, සටකපටකම් හා භේද කිරීම් සහිත වූයේ ද, ශස්ත්‍ර ප්‍රහාර බහුල ව ඇත්තේ සංඵේට නම් (**නාට්‍යශාස්ත්‍ර, XX**.65-71). මෙම වෘත්තිය රෞද්‍ර හා භයානක රස ප්‍රකට කරයි (**නාට්‍යශාස්ත්‍ර, XX**.74).

ශෘංගාර රස කෛශිකී වෘත්තියට ද, වීර රස සාත්වතී වෘත්තියට ද, රෞද්‍ර බීභත්ස ආරභටී වෘත්තියට ද, සියලු රසයන්ට සම්බන්ධ ව භාරතී වෘත්තිය ද යෙදිය යුතු බව ධනංජය දක්වයි (**දශරූප, II**.95.). එය ම නාට්‍යශාස්ත්‍රකරු දක්වන්නේ මෙසේ යි.

ශෘංගාරේ කෞශිතකී වීරේ සාත්වත්‍යාරභටී පුනඃ

රසේ රෞද්‍රෙ ච බීභත්සේ වෘත්තිඃ සර්වත්‍ර භාරතී

චතස්‍රො වෘත්තයො හ්‍යෙතාඃ සර්වනාට්‍යස්‍ය මාතෘකාඃ

ස්‍යුර්නායකාදිව්‍යාපාර විශේෂා නාටකාදිෂු (**නාට්‍යශාස්ත්‍ර, VI** -122/123).

නාට්‍ය ශාස්ත්‍රය අනුගමනය කරමින් ශෘංගභූපාල චතුර්වෘත්ති චතුර්වේදයට සම්බන්ධ කොට දක්වා තිබේ. භාරතී ඍග්වේදයට, සාත්වතී යජුර්වේදයට, කෛශිකී සාමන්වේදයට, ආරභටී අථර්වවේදයට වශයෙනි (**රසවර්ණසුධාකර, 260**).

## සමාලෝචනය

නාට්‍ය වෘත්ති පිළිබඳ පූර්ණ විග්‍රහයක් **නාට්‍යශාස්ත්‍ර** කෘතියෙන් සම්පාදනය කර ඇති බව ඉහත විමසීමෙන් පෙනී යයි. දශරූප කතුවරයා ද එම උත්සාහය ගෙන තිබේ. මෙම මූලධර්ම භාවිතයෙන් ගොඩනැඟුණු සංස්කෘත නාට්‍යය ප්‍රමාණය අල්ප වීම අපගේ අභාග්‍යක් නමුත් පෙරදිග වෙනත් භාෂාවලින් ගොඩනැඟුණු නාට්‍යය සඳහා මෙම මූලධර්ම මගින් සපයන ආලෝකය අත්‍යුත්කෘෂ්ට වේ. පාත්‍රයාගේ හැසිරීම් පිළිබඳ සියුම් තැන් පවා ස්පර්ශ කර ගොඩනඟා ඇති මෙම වෘත්ති නාට්‍යයේ ජීවය රැඳි රස ගොඩනඟන අංගෝපාංග වේ.

## ප්‍රාථමික මූලාශ්‍රය


වෝල්ටර් මාරසිංහ. (2016). **සංස්කෘත නාට්‍යය හා රංගශිල්පය.** කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි. (2012). **භාරතීය රංග කලාව හා භරතමුනි.** දෙවැනි කොටස. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

**Dasarūpaka of Dhanañjaya with Avaloka of Dhanika** by R.S. Tripathi. Varanasi: Vishwavidyalaya Prakashan.

Dasgupta, S.N. (1962). **A History of Sanskrit Literature**. Classical Period. University of Calcutta.

**Nātyaśāstra of Baratamuni, With the commentary Abhinavabhāratī by abhinavaguptācārya**, (1964) Vol- iv, Edited by Late M. Ramakrishna, Kavi, M.A. etc... Oriental Institute Baroda.


## ද්විතීයක මූලාශ්‍රය


**ධනංජයරචිත දශරූප.** (1998). (පරි.). එස්. වීරතුංග. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

**භරත මුනි විරචිත නාට්‍යශාස්ත්‍රය**, දෙවැනි කොටස. (2007). (පරි.). හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ගොඩගේ සහෝදරයෝ.

**භරතමුනි ප්‍රණීත නාට්‍යශාස්ත්‍ර.** (2003). ප්‍රථම භාගය, ද්විතීය සංස්කරණය. වෝල්ටර් මාරසිංහ. කොළඹ:

**භරතමුනි ප්‍රණීත නාට්‍යශාස්ත්‍ර.** (2005). (විතීය භාගය) වෝල්ටර් මාරසිංහ. කොළඹ:

**භරතමුනි ප්‍රණීත නාට්‍යශාස්ත්‍ර.** (2014). (තෘතීය භාගය) වෝල්ටර් මාරසිංහ. කොළඹ: